මුදල් විශුද්ධිකරණයට සහ ත්‍රස්තවාදී හේතූන් සඳහා අරමුදල් සැපයීමට විරුද්ධ වීම

අපි මුදල් විශුද්ධිකරණයට හෝ ත්‍රස්තවාදයට මුදල් සැපයීමට සහභාගී නොවෙමු

අපි මුදල් විශුද්ධිකරණය හෝ ත්‍රස්තවාදී අරමුදල් සැපයීම තුළ නියැළීම වැළකීමෙන් නීත්‍යානුකූල සහ විනිවිද ව්‍යාපාරික ගනුදෙනු සඳහා දායක වෙමු

අපි අපේ ව්‍යාපාරික ගනුදෙනු අවංකව සහ විනිවිදව සිදු කරන්නෙමු. එම නිසා, එය අපේ කීර්ති නාමයට දැඩිව හානි කළ හැකි අතර අප මත විශ්වාසය අඩපණ කළ හැකි බැවින් අපි මුදල් විශුද්ධිකරණයට හෝ ත්‍රස්තවාදී අරමුදල් සැපයීමට සම්බන්ධ වීමෙන් වළකින්නෙමු.

මුදල් විශුද්ධිකරණය යනු නීති විරෝධී ක්‍රියාකාරකම්වලින් උපයන ලද මුදල එහි නීති විරෝධී මූලාරම්භය සැඟවීමට ගනුදෙනු සහ ව්‍යාපාර මාලාවක් හරහා එය නීත්‍යානුකූල බව දක්වන ක්‍රියාවලිය වෙයි. අපි මුදල් විශුද්ධිකරණය ත්‍රස්තවාදී අරමුදල් සැපයීමට ද දායක විය හැකි බැවින් එයට එරෙහිව පියවර ගනිමු.

අපි මුදල් විශුද්ධිකරණය සහ ත්‍රස්තවාදයට අරමුදල් සැපයීම වැළැක්වීමට අභ්‍යන්තර ක්‍රියා පටිපාටි ස්ථාපිත කර ඇත

අප ළඟ මුදල් ගෙවීම් භාර ගැනීමට සහ සිදු කිරීමට සීමා ඇත. අපි අපේ ව්‍යාපාරික හවුල්කරුවන් නොවන තෙවන පාර්ශව වලින් මුදල් භාර ගැනීම හෝ ගෙවීම් නොකරමු. අපි නොදන්නා පාර්ශව සමග ක්‍රියා කිරීමට පෙර සහ පවතින ව්‍යාපාරික හවුල්කරුවන් සඳහා ව්‍යාපාරික හවුල්කරු යථායෝගී පරීක්ෂාවක් කරන්නෙමු.

අපි සැලකිලිමත් විය යුත්තේ ඇයි?

මුදල් විශුද්ධිකරණය සහ ත්‍රස්තවාදී අරමුදල් සැපයීම වැළැක්වීමෙන්, අපි ගෝලීය මූල්‍ය පද්ධතියේ අවංක බවට සහ ස්ථීරත්වයට දායක වන අතර ඒ ආශ්‍රිත අවදානම්වලින් Continental ආරක්ෂා කරමු.

ඔබ සැක සහිත දෙයක් දකින්නේ නම් වහාම Compliance-ට දැනුම් දිය යුතුය.

තව සොයා ගන්න:

› Standard Anti-Money Laundering

01 පෙරවදන
02 අපි අපේ අගයන් මත ක්‍රියා කරමු
03 අපි එකිනෙකාට ගරු කරමු
04 අපි වගකීමෙන් ක්‍රියා කරමු
05 අපි ව්‍යාපාරය සාධාරණව පවත්වමු
ළිණ සහ ආගන්තුක සත්කාරය
පුණ්‍ය පරිත්‍යාග සහ අනුග්‍රාහකත්ව
සාධාරණ තරඟය
මුදල් විශුද්ධිකරණයට සහ තුස්තවාදී හේතූන් සඳහා අරමුදල් සැපයීමට විරුද්ධ වීම
අපනයන පාලනය සහ සම්බාධක
බැදියා පිළිගැටුම
වංචාව, සොරකම, සහ මංකොල්ලය
ව්‍යාපාරික හවුල්කරුවන් සමග කටයුතු කිරීම
06 අපි තොරතුරු සුරක්ෂිතව පරිහරණය කරමු
07 වචනාවලිය
08 මුද්‍රණය

05

අපනයන පාලනය සහ සම්බාධක

අපි ජාත්‍යන්තර වෙළඳාමේ නිරත වන අතර අදාළ සියලු රීතිවලට ගරු කරමු

අපි අපේ වාණිජ සම්බන්ධතා ගැන අවධානයෙන් සිටිමු

අපි දුරදිග යන බලපෑම් සමග ගෝලීය පරිමාණයකින් වාණිජ සබඳතා ක්‍රියාත්මක කරන්නෙමු.
අපි භාණ්ඩ, මෘදුකාංග, තාක්ෂණය සහ සේවා හුවමාරුව සඳහා ආර්ථික සම්බාධකවලට සහ අනෙකුත් සීමා කිරීම්වලට අනුකූල වීමෙන් අපේ ක්‍රියා ආචාර ධර්මීය පුරුදුවලට අපේ හවුල් කැප වීම පිළිබිඹු කිරීම තහවුරු කරමු.

අපි ජාත්‍යන්තර මාර්ගෝපදේශ සහ රෙගුලාසි අනුගමනය කරමු

අපි අපේ ව්‍යාපාරික තීරණවල ලොව පුරා අදාළ වන නීති ප්‍රවේශමෙන් නිරීක්ෂණ කරමු.
අපි ව්‍යාපාර කරන භූගෝලීය ප්‍රදේශවල සීමා කිරීම් ප්‍රවේශමෙන් සලකා බලන බව අපි තහවුරු කරමු.
අපි සැක සහිත, සම්බාධක පනවන ලද හෝ අසාදු ලේඛන ගත කරන ලද පාර්ශව සමග කිසිම විභව ව්‍යාපාරයක් සංවර්ධනය නොකරමු.
අපි සේවා සහ භාණ්ඩ ආනයනකරුවෙක් සහ අපනයනකරුවෙක් ලෙස අපේ කාර්ය භාරය තුළ අපේ කැප වීම තහවුරු කරමු.

අපි අපේ ව්‍යාපාරික හවුල්කරුවන් සමග නීත්‍යානුකූල සබඳතා වර්ධනය කරමු

අපි ඕනෑම වාණිජ ගනුදෙනුවකට පෙර සම්බාධක පනවන ලද රටවල්, සමාගම් සහ පුද්ගලයින් කඩිසරව හඳුනා ගනිමු.
අපි අපනයන පාලන සහ සම්බාධක රීතිවලට අනුකූල වීමට අපේ ක්‍රියාමාර්ග ගැන අපේ ගනුදෙනුකරුවන් සහ සැපයුම්කරුවන් සමග විනිවිදව සහ අවංකව සන්නිවේදන කරමු.

අපි යුද අවි පිළිබඳ ව්‍යාපාරවල නියැළෙන්නේ නැත

අපි Continental හි හමුදා ව්‍යාපාර ප්‍රතිපත්තියට අනුව කිසිම යුද අවි හෝ තහනම් කරන ලද යුද්ධෝපකරණ සංවර්ධනය, නිෂ්පාදනය, හෝ විකිණීම නොකරන අතර ඒ පිළිබඳ කිසිම තාක්ෂණික සහයක් දෙන්නේ නැත.

අපි සැලකිලිමත් විය යුත්තේ ඇයි?

අපනයන පාලනය සහ සම්බාධක පිළිබඳ රීති සම්බාධක පනවන ලද රටවල්, සමාගම් සහ පුද්ගලයින් වෙත භයානක භාණ්ඩ, අරමුදල් සහ සේවා ගලා යාම නියාමන කිරීමෙන් ගෝලීය ස්ථාවරත්වය සහ සාමය පවත්වා ගනියි.
අපි මෙම රීති පිළිපැදීමෙන් ආරක්ෂිත සහ ධර්මිෂ්ඨව යහපත් ගෝලීය ව්‍යාපාරික පරිසරයකට දායක වෙමු.

තව සොයා ගන්න:

- Policy Military Business
- Manual Tax, Customs & Export Control Management System
- Country Business Restrictions

ඔබට සහය අවශ්‍ය නම්, Compliance සම්බන්ධ කර ගන්න.

01 පෙරවදන
02 අපි අපේ අගයන් මත ක්‍රියා කරමු
03 අපි එකිනෙකාට ගරු කරමු
04 අපි වගකීමෙන් ක්‍රියා කරමු
05 අපි ව්‍යාපාරය සාධාරණව පවත්වමු
ළිණ සහ ආගන්තුක සත්කාරය
පුණ්‍ය පරිත්‍යාග සහ අනුග්‍රාහකත්ව
සාධාරණ තරඟය
මුදල් විශුද්ධිකරණයට සහ තුස්තවාදී හේතූන් සඳහා අරමුදල් සැපයීමට විරුද්ධ වී
අපනයන පාලනය සහ සම්බාධක
බැඳියා පිළිගැටුම
වංචාව, සොරකම, සහ මංකොල්ලය
ව්‍යාපාරික හවුල්කරුවන් සමග කටයුතු කිරීම
06 අපි තොරතුරු සුරක්ෂිතව පරිහරණය කරමු
07 වචනාවලිය
08 මුද්‍රණය

05

බැඳියා පිළිගැටුම

අපි ඉහළම ආචාර ධර්ම ප්‍රමිතිවලට ව්‍යාපාරය පවත්වන්නෙමු

අපි පුද්ගලික සහ වෘත්තීය ලැදිකම් අතර ගැටුම් වළක්වමු

Continental සේවකයින්ට තම රැකියාවෙන් පිටත ක්‍රියාකාරකම්වල යෙදීමට ඇති නිදහසට සහ අයිතියට ගරු කරයි. අපට අපේ රැකියා සම්බන්ධතාව තුළ Continental හි යහපත වෙනුවෙන් ක්‍රියා කිරීමට පක්ෂපාතීත්වයේ යුතුකමක් සහ වගකීමක් ද ඇත.

අපි අපේ පුද්ගලික ලැදිකම් සහ පුද්ගලික සැලකීම් අපේ වෘත්තීය විනිශ්චයට සහ අරමුණු ලත් තීරණ ගැනීමට බාධා කරන අවස්ථා වළක්වා ගනිමු. පුද්ගලික සබඳතා, මූල්‍ය අවශ්‍යතා හෝ බාහිර ක්‍රියාකාරකම් රැකියාවට අදාළ තීරණවලට බලපාන විට සහ Continental හි ලැදිකම් සමග ගැටෙන විට එවැනි බැඳියා පිළිගැටුම් ඇති වෙයි.

එවැනි තත්වයක් ඇති වන්නේ නම්, අපි අපේ Standard Business Ethics තුළ සඳහන් වන පරිදි විනිවිදව සහ කාලෝචිත ආකාරයකින් විය හැකි බැඳියා පිළිගැටුම් හෙළදරවු කරමු.

අපි සැලකිලිමත් විය යුත්තේ ඇයි?

බැඳියා පිළිගැටුම් වළක්වා ගැනීම සාධාරණ තීරණ ගැනීම තහවුරු කරන අතර විශ්වාසය පවත්වා ගනියි. පුද්ගලික ලැදිකම් වෘත්තීය විනිශ්චය සමග ගැටෙන විට එය පක්ෂග්‍රාහී තීරණවලට මග සැලසිය හැකි අතර, අපේ කීර්ති නාමයට සහ කායීය සාධනයට හානි කළ හැක.

බැඳියා පිළිගැටුම වැළැක්වීමෙන්, අපි අවංකත්වය, විනිවිද භාවය, සහ පක්ෂපාතීත්වය ප්‍රවර්ධනය කරමු, ඒවා අපේ දිගු කාලීන සාර්ථකත්වයට සහ ධනාත්මක වැඩ පරිසරයට අත්‍යවශ්‍ය වෙයි.

තව සොයා ගන්න:

› Standard Business Ethics

ඔබට සහය අවශ්‍ය නම්, Compliance සම්බන්ධ කර ගන්න.

01 පෙරවදන
02 අපි අපේ අගයන් මත ක්‍රියා කරමු
03 අපි එකිනෙකාට ගරු කරමු
04 අපි වගකීමෙන් ක්‍රියා කරමු
05 අපි ව්‍යාපාරය සාධාරණව පවත්වමු
ළිණ සහ ආගන්තුක සත්කාරය
පුණ්‍ය පරිත්‍යාග සහ අනුග්‍රාහකත්ව
සාධාරණ තරඟය
මුදල් විශුද්ධිකරණයට සහ තුස්තවාදී හේතූන් සඳහා අරමුදල් සැපයීමට විරුද්ධ වීම
අපනයන පාලනය සහ සම්බාධක
බැදියා පිළිගැටුම
වංචාව, සොරකම, සහ මංකොල්ලය
ව්‍යාපාරික හවුල්කරුවන් සමග කටයුතු කිරීම
06 අපි තොරතුරු සුරක්ෂිතව පරිහරණය කරමු
07 වචනාවලිය
08 මුද්‍රණය

05

වංචාව, සොරකම, සහ මංකොල්ලය

අපි ඉහළම ආචාර ධර්ම ප්‍රමිතිවලට ව්‍යාපාරය පවත්වන්නෙමු

අපි වංචාව, සොරකම, සහ මංකොල්ලය හෙළා දකිමු

අවංකත්වය යනු Continental තුළ අපි එකිනෙකා කෙරෙහි තබන විශ්වාසයේ මූලික සලකුණක් වන අතර අපේ ව්‍යාපාරික හවුල්කරුවන් අප ගැන තබන විශ්වාසයේ මූලික පදනම වෙයි.

Continental හි බවට කියනු ලබන යහපත සඳහා වූවත් එහි සියලු පැතිවලින් වංචාව පිළිගත නොහැක, එය අපේ අගයවල් උල්ලංඝන කරන අතර දැඩි ලෙස තහනම් කරනු ලබයි. එවැනි හැසිරීම් එය ගමන් වියදම් වංචා කිරීම, සැපයුම්කරුවන්ගෙන් අල්ලස් ගැනීම, ආදායම අධිතක්සේරු කිරීම හෝ වෙනත් වංචනික ක්‍රියා වූවත්, නොඉවසනු ලබයි.

අපි අපේ භූමිකා තුළ අප මත විශ්වාසය තබනු ලබන මූල්‍ය සහ වෙනත් කටයුතුවලට වගකීම දරන්නෙමු. අපි මෙම ප්‍රකාර Continental හි ලැදිකම් හැර වෙනත් අවශ්‍යතා සඳහා භාවිත නොකරමු. සමාගමේ මුදල් හෝ වත්කම් පුද්ගලික භාවිතය සඳහා ගැනීම හෝ වෙනත් වංක ක්‍රියා ඇතුළු එවැනි ක්‍රියා පිළිගත නොහැක.

සොරකම නොඉවසනු ලබයි. අපි අපේ ස්පර්ශ කල හැකි සහ නොහැකි සමාගම් දේපළ අගය කරන අතර නිසි සැලකිල්ලෙන් සහ වගකීමෙන් යුතුව ඒවා භාවිත කරමු.

අපි සැලකිලිමත් විය යුත්තේ ඇයි?

වංචාව, වංචා, සොරකම් සහ මංකොල්ල සේවකයින්, ව්‍යාපාරික හවුල්කරුවන් සහ ආයෝජකයින් අතර විශ්වාසය අඩපණ කරන අතර එය ව්‍යාපාරික සබඳතාවලට සහ අනාගත අවස්ථාවලට හානි විය හැක. මෙම සදාචාර විරෝධී හැසිරීම් වැළකීමෙන්, අපි ආරක්ෂිත සහ විශ්වසනීය පරිසරයක් තහවුරු කරමු, ස්ථායිතාව සහ වර්ධනය ප්‍රවර්ධනය කරමු.

තව සොයා ගන්න:

› Standard Business Ethics

ඔබට සහය අවශ්‍ය නම්, Compliance සම්බන්ධ කර ගන්න.

01 පෙරවදන
02 අපි අපේ අගයන් මත ක්‍රියා කරමු
03 අපි එකිනෙකාට ගරු කරමු
04 අපි වගකීමෙන් ක්‍රියා කරමු
05 අපි ව්‍යාපාරය සාධාරණව පවත්වමු
ළිණ සහ ආගන්තුක සත්කාරය
පුණ්‍ය පරිත්‍යාග සහ අනුග්‍රාහකත්ව
සාධාරණ තරඟය
මුදල් විශුද්ධිකරණයට සහ තුස්තවාදී හේතූන් සඳහා අරමුදල් සැපයීමට විරුද්ධ වී
අපනයන පාලනය සහ සම්බාධක
බැදියා පිළිගැටුම
වංචාව, සොරකම, සහ මංකොල්ලය
ව්‍යාපාරික හවුල්කරුවන් සමග කටයුතු කිරීම
06 අපි තොරතුරු සුරක්ෂිතව පරිහරණය කරමු
07 වචනාවලිය
08 මුද්‍රණය

05

ව්‍යාපාරික හවුල්කරුවන් සමග කටයුතු කිරීම

අපි ඉහළම ආචාර ධර්ම ප්‍රමිතිවලට ව්‍යාපාරය පවත්වන්නෙමු

අපි අපේ ව්‍යාපාරික හවුල්කරුවන් නිසි සැලකිල්ලෙන් තෝරා ගෙන අන්තර් ක්‍රියා කරමු

අපි අපේ ව්‍යාපාරය තුළ ඉහළ ආචාර ධර්ම සහ අවංකත්ව ප්‍රමිති මත පදනම්ව ක්‍රියා කරන අතර සැපයුම්කරුවන්, වෙළෙන්දන් සහ අතරමැදියන් ඇතුළු අපේ සියලුම ව්‍යාපාරික හවුල්කරුවන්ගෙන් ද එයම අපේක්ෂා කරමු.

අපි එබැවින් අපේ ව්‍යාපාරික හවුල්කරුවන් අවංකත්ව, අනුකූලතාව (Compliance) සහ තිරසාර බව පිළිබඳ අපේ ඉහළ අවශ්‍යතා සපුරා ලීම සහතික කිරීම සඳහා අවශ්‍ය සියලු පියවර ගනිමු. විභව ව්‍යාපාරික හවුල්කරුවන් සමග ව්‍යාපාරික සබඳතාවලට එළඹීමට පෙර අවදානම් පාදක පිරික්සුම් ක්‍රියාවලියක් සිදු කිරීමද මෙයට ඇතුළු වෙයි.

අපි අපේ ව්‍යාපාරික හවුල්කරුවන් අපේ මූලික අගයවලට සහ මූලධර්ම වලට අනුකූල වීම අවශ්‍ය කරමු

අපි Continental හි මූලික අගයවල් සහ මූලධර්ම පිළිබිඹු කරන Business Partner Code of Conduct පිළිගෙන පිළිපැදීමට අපේ ව්‍යාපාරික හවුල්කරුවන්ගෙන් අවශ්‍ය කරමු. අපේ ව්‍යාපාරික හවුල්කරුවන් සමග ඇති ව්‍යාපාරික සම්බන්ධතාව පුරා, අපි ව්‍යාපාරික හවුල්කරුවන්ගෙන් නුසුදුසු ප්‍රතිලාභ නොදෙන අතර පිළිගන්නේ නැත, තවද අපේ අභ්‍යන්තර රීති සහ අවශ්‍යතා දැඩි ලෙස අනුගමනය කරන්නෙමු.

අපි සැලකිලිමත් විය යුත්තේ ඇයි?

ව්‍යාපාරික හවුල්කරුවන් පරීක්ෂාකාරීව තෝරා ගැනීම වැදගත් වන්නේ එය හවුල් අගයවල් සහ ආචාර ධර්ම ප්‍රමිති සහතික කරන බැවිනි. මෙය අපට Continental සහ අපේ ව්‍යාපාරික හවුල්කරුවන් යන දෙපිරිසටම නීතිමය ගැටලු, කීර්ති නාමයට හානි සහ මූල්‍ය අවදානම් වැළැක්වීමට උදවු කරයි. විශ්වසනීය ව්‍යාපාරික හවුල්කරුවන් සමග පෙළ ගැසීමෙන්, අපට අඛණ්ඩතාව, විශ්වසනීයත්වය සහ දිගුකාලීන සාර්ථකත්වය පවත්වා ගත හැක.

තව සොයා ගන්න:

- Business Partner Code of Conduct
- Standard Application of the Business Partner Code of Conduct (”BPCoC”)
- Standard Business Partner Due Diligence (BPDD)

06

අපි තොරතුරු සුරක්ෂිතව පරිහරණය කරමු

01 පෙරවදන
02 අපි අපේ අගයන් මත ක්‍රියා කරමු
03 අපි එකිනෙකාට ගරු කරමු
04 අපි වගකීමෙන් ක්‍රියා කරමු
05 අපි ව්‍යාපාරය සාධාරණව පවත්වමු
06 **අපි තොරතුරු සුරක්ෂිතව පරිහරණය කරමු**
බුද්ධිමය දේපළ සහ රහසිගත තොරතුරු
තොරතුරු ආරක්ෂාව සහ තොරතුරු වර්ගීකරණය
දත්ත ආරක්ෂාව
කෘත්‍රිම බුද්ධිය
සටහන් තැබීම සහ හෙළිදරවු කිරීම
අභ්‍යන්තර වෙළඳාම
07 වචනාවලිය
08 මුද්‍රණය

06

බුද්ධිමය දේපළ සහ රහසිගත තොරතුරු

අපි Continental හි බුද්ධිමය දේපළ සහ රහස්‍ය තොරතුරු ආරක්ෂා කරන අතර තෙවන පාර්ශවල අයිතිවාසිකම්වලට ගරු කරමු

අපි බුද්ධිමය දේපළ සහ රහස්‍ය තොරතුරු අගය කරන අතර ඒවා ආරක්ෂා කරමු

අපි ගෝලීය තාක්ෂණික නවෝත්පාදකයෙක් වෙමු. අපේ ව්‍යාපාරික සාර්ථකත්වයේ කොටසක් පේටන්ට් බලපත්‍ර, වෙළෙඳ ලකුණු, ලාංඡන, ප්‍රකාශන හිමිකම්, සහ සැලසුම් ඇතුළු බුද්ධිමය දේපළ (IP) මත රඳා පවතියි. අපි වෙළෙඳ රහස්, දැනුම සහ සාමාන්‍යයෙන් රහසිගත තොරතුරු ලෙස හඳුන්වනු ලබන වෙනත් ආකාරයේ හිමිකාර තොරතුරු ද භාවිතයට ගනිමු.

රහසිගත තොරතුරු හෙළි කිරීම හෝ නොලැබීම Continental හට සැලකිය යුතු බලපෑමක් ඇති කළ හැක. අපේ බුද්ධිමය දේපළ සහ රහස්‍ය තොරතුරු ආරක්ෂා කිරීම අපේ වගකීම වෙයි. ඒවා අපේ තාක්ෂණික සහ වාණිජ සාධන ආරක්ෂා කිරීමට සහ තරඟකාරීව සිටීමට අපට අයිතිය දෙන වටිනා ස්පර්ශ කල නොහැකි වත්කම් වෙයි. අපි ඒවා අවසර ලත් සේවකයින් නොවන හෝ තෙවන පාර්ශව අය විසින් අනිසි ලෙස භාවිත කළ නොහැකි බව තහවුරු කරමු.

අපි රහස්‍ය තොරතුරු ආරක්ෂා කිරීමට අවශ්‍ය සෑම ක්‍රියාමාර්ගයක්ම ගනිමු

අපි දැඩි විශ්වාසයක් පවත්වා ගන්නා අතර රහසිගත තොරතුරු අනිසි ලෙස භාවිත කිරීම හෝ හෙළිදරවු කිරීම සිදු නොකරමු. අපි දැන ගත යුතු පදනමක් මත එවැනි දේවලට ප්‍රවේශය දැඩි ලෙස සීමා කරමු. අපි රහසිගත තොරතුරු වර්ග කර සලකුණු කරන්නෙමු. Continental හට එසේ කිරීමට ව්‍යාපාරික අවශ්‍යතාවක් තිබේ නම් සහ රහස්‍යතාව පවත්වා ගත හැකි නම් මිස, අපි තෙවන පාර්ශව සමග රහසිගත තොරතුරු බෙදා නොගනිමු. අපට අහම්බෙන් රහසිගත තොරතුරු වෙත ප්‍රවේශය ලැබෙන්නේ නම්, අපි එවැනි දත්ත කාන්දු වීම් වසා දැමීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගන්නා අතර ඒ සඳහා එකිනෙකාට උදව් කරමු. අපි Continental හැර යන්නේ නම්, අපි රහසිගත තොරතුරු ලැබීම, තබා ගැනීම, අනිසි භාවිතය හෝ හෙළිදරවු කිරීම නොකළ යුතු ම ය.

01 පෙරවදන
02 අපි අපේ අගයන් මත ක්‍රියා කරමු
03 අපි එකිනෙකාට ගරු කරමු
04 අපි වගකීමෙන් ක්‍රියා කරමු
05 අපි ව්‍යාපාරය සාධාරණව පවත්වමු
06 **අපි තොරතුරු සුරක්ෂිතව පරිහරණය කරමු**
බුද්ධිමය දේපළ සහ රහසිගත තොරතුරු
තොරතුරු ආරක්ෂාව සහ තොරතුරු වර්ගීකරණය
දත්ත ආරක්ෂාව
කෘත්‍රිම බුද්ධිය
සටහන් තැබීම සහ හෙළිදරවු කිරීම
අභ්‍යන්තර වෙළඳාම
07 වචනාවලිය
08 මුද්‍රණය

06

බුද්ධිමය දේපළ සහ රහසිගත තොරතුරු

අපි Continental හි බුද්ධිමය දේපළ සහ රහස්‍ය තොරතුරු ආරක්ෂා කරන අතර තෙවන පාර්ශවල අයිතිවාසිකම්වලට ගරු කරමු

අපි තෙවන පාර්ශව වල බුද්ධිමය දේපළට සහ රහස්‍ය තොරතුරු වලට ගරු කරමු

අපි අපේ දේපළවලට ගරු කළ යුතු ආකාරයෙන් ම අන් අයගේ බුද්ධිමය දේපළවලට ගරු කළ යුතුය. පර්යේෂණ සහ සංවර්ධන ක්‍රියාවලියේ කොටසක් ලෙස, අපි අන් අයගේ පවතින බුද්ධිමය දේපළ සොයන අතර, පවතින IP රෙගුලාසිවලට අනුකූලව ක්‍රියා කරමු.

අපි සැලකිලිමත් විය යුත්තේ ඇයි?

අපේ තරඟය පවත්වා ගැනීමට සහ අපේ නවෝත්පාදන ආරක්ෂා කිරීමට බුද්ධිමය දේපළ සහ රහස්‍ය තොරතුරු ආරක්ෂා කිරීම වැදගත් වෙයි. අපි මෙම වත්කම්වලට ගරු කිරීමෙන් සහ සුරක්ෂිත කිරීමෙන් අපේ ව්‍යාපාරයේ අඛණ්ඩ සාර්ථකත්වයට සහ අවංකකම තහවුරු කරමු. මෙම කැපවීම තෙවන පාර්ශවවල බුද්ධිමය දේපළවලට සහ රහස්‍ය තොරතුරුවලට ගරු කිරීම දක්වා ද විහිදෙයි.

ඔබට සහය අවශ්‍ය නම්, බුද්ධිමය දේපළ අංශය සම්බන්ධ කර ගන්න.

01 පෙරවදන
02 අපි අපේ අගයන් මත ක්‍රියා කරමු
03 අපි එකිනෙකාට ගරු කරමු
04 අපි වගකීමෙන් ක්‍රියා කරමු
05 අපි ව්‍යාපාරය සාධාරණව පවත්වමු
06 **අපි තොරතුරු සුරක්ෂිතව පරිහරණය කරමු**
- බුද්ධිමය දේපළ සහ රහසිගත තොරතුරු
- **තොරතුරු ආරක්ෂාව සහ තොරතුරු වර්ගීකරණය**
- දත්ත ආරක්ෂාව
- කෘත්‍රිම බුද්ධිය
- සටහන් තැබීම සහ හෙළිදරවු කිරීම
- අභ්‍යන්තර වෙළඳාම

07 වචනාවලිය
08 මුද්‍රණය

06

තොරතුරු ආරක්ෂාව සහ තොරතුරු වර්ගීකරණය

අපි සියලු තොරතුරු එහි සංවේදීතාව මත පදනම්ව වර්ගීකරණය කරන අතර පොදු නොවන තොරතුරු "දැන ගත යුතු" පදනම මත හසුරුවන්නෙමු

අපි ව්‍යාපාරික වත්කමක් ලෙස තොරතුරු අගය කරන අතර එය ආරක්ෂා කිරීමට කැප වී සිටිමු

අපේ ව්‍යාපාරය Continental හි සහ අපේ ව්‍යාපාරික හවුල්කරුවන්ගේ දත්ත ඇතුළු තොරතුරු මගින් මෙහෙයවනු ලබයි. අපි සයිබර් අපරාධ වැළැක්වීමට හෝ ඒවායේ ප්‍රතිවිපාක අවම කිරීමට අදාළ තොරතුරු සහ තොරතුරු පද්ධති ආරක්ෂා කරමු.

අපි අපේ ව්‍යාපාර හවුල්කරු ආචාර ධර්ම සංග්‍රහය හරහා අපේ ව්‍යාපාරික හවුල්කරුවන්ට තොරතුරු ආරක්ෂණ වගකීම් ගැන දැනුම් දෙන්නෙමු. ඒ අනුව, අපි ආදර්ශයෙන් මඟ පෙන්වීම යන අපේ වගකීම ඉටු කරමු.

අපි තොරතුරු පරෙස්සමෙන් සහ වගකීමෙන් පරිහරණය කරමු

ලැප්ටොප්, ෆ්ලෑෂ් ඩ්‍රයිව් සහ ස්මාර්ට්ෆෝන් වැනි ඉලෙක්ට්‍රොනික උපාංගවල මෙන්ම පුද්ගලයින්ගේ මනස හෝ භෞතික ලේඛන වැනි තොරතුරු තාක්ෂණ නොවන සම්පත්වල ගෙන යන දත්ත අස්ථාන ගත වීමේ, හැසිරවීමේ සහ අනිසි ලෙස භාවිතා කිරීමේ අවදානමක් ඇත. සියලු තොරතුරු උපරිම සැලකිල්ලෙන් හා ආරක්ෂාවෙන් හසුරුවන බවට අපි සහතික වෙමු, එහි රහස්‍යභාවය, අඛණ්ඩතාව සහ ලබා ගත හැකි බව පවත්වා ගන්නෙමු. Continental තුළ, අපි භාවිත කරන්නේ දේශීය තොරතුරු තාක්ෂණ හෝ සයිබර් ආරක්ෂාව විසින් කළමනාකරණය කරන සහ අනුමත කෙරෙන ඉලෙක්ට්‍රොනික උපාංග පමණක් වන අතර එය ඒවා කඩිසරව හසුරුවන බවත් වෘත්තීය අරමුණු සඳහා පමණක් ක්‍රියා කරවන බවත් තහවුරු කරමු.

01 පෙරවදන
02 අපි අපේ අගයන් මත ක්‍රියා කරමු
03 අපි එකිනෙකාට ගරු කරමු
04 අපි වගකීමෙන් ක්‍රියා කරමු
05 අපි ව්‍යාපාරය සාධාරණව පවත්වමු
06 **අපි තොරතුරු සුරක්ෂිතව පරිහරණය කරමු**
- බුද්ධිමය දේපළ සහ රහසිගත තොරතුරු
- **තොරතුරු ආරක්ෂාව සහ තොරතුරු වර්ගීකරණය**
- දත්ත ආරක්ෂාව
- කෘත්‍රිම බුද්ධිය
- සටහන් තැබීම සහ හෙළිදරවු කිරීම
- අභ්‍යන්තර වෙළඳාම

07 වචනාවලිය
08 මුද්‍රණය

06

තොරතුරු ආරක්ෂාව සහ තොරතුරු වර්ගීකරණය

අපි සියලු තොරතුරු එහි සංවේදීතාව මත පදනම්ව වර්ගීකරණය කරන අතර පොදු නොවන තොරතුරු "දැන ගත යුතු" පදනම මත හඳුරුවන්නෙමු

අපි අපේ අගයන් වලට සහ සන්නාම කීර්ති නාමයට අනුකූලව බාහිරව Continental නියෝජනය කරන්නෙමු

අපි Continental තුළ අපේ සාමූහිකත්වය සහ අපේ ආයතනික සංස්කෘතිය ගැන ආඩම්බර වෙමු. අපි සැවොම Continental සේවක උපදේශකයින් ලෙස බාහිර ලෝකයට ප්‍රවර්ධන කිරීමට පොලඹවනු ලබන්නේ ඒ නිසා ය.

අපි සමාජ මාධ්‍ය භාවිත කර Continental නියෝජන කරන අතර සෑම විටම අපේ අගයවල් සහ සන්නාම කීර්තිය ආරක්ෂා කරමු. අපි අපේ බාහිර සන්නිවේදනය තුළ සේවකයින්, ව්‍යාපාරික හවුල්කරුවන් සහ අනෙකුත් කොටස්කරුවන්ගේ රහස්‍යතාවට, පෞද්ගලිකත්වයට සහ අයිවාසිකම් වලට ගරු කරමු. අපි Continental වෙනුවෙන් සන්නිවේදනය කරන්නේ අපට එසේ කිරීමට අවසර තිබේ නම් පමණයි. අපි කිසි විටෙක අපේ කීර්තියට හානි කළ හැකි හෝ අපේ අගයවල් සහ රීති උල්ලංඝන කළ හැකි අන්තර්ගත පළ නොකරමු.

අපි සැලකිලිමත් විය යුත්තේ ඇයි?

ඕනෑම තොරතුරු ආරක්ෂණ සිදු වීමක ප්‍රතිවිපාක Continental හට අතිශයින්ම හානිකර විය හැක.

තව සොයා ගන්න:

- Policy Information Security
- Standard Information Security Framework
- Standard Classification and Control of Information
- Standard Social Media Communications
- Policy Global Communications
- Business Partner Code of Conduct

ඔබට සහය අවශ්‍ය නම්, ඔබේ වගකීම ලත් තොරතුරු නාක්ෂණ අංශය සම්බන්ධ කර ගන්න.

01 පෙරවදන
02 අපි අපේ අගයන් මත ක්‍රියා කරමු
03 අපි එකිනෙකාට ගරු කරමු
04 අපි වගකීමෙන් ක්‍රියා කරමු
05 අපි ව්‍යාපාරය සාධාරණව පවත්වමු
06 **අපි තොරතුරු සුරක්ෂිතව පරිහරණය කරමු**
බුද්ධිමය දේපළ සහ රහසිගත තොරතුරු
තොරතුරු ආරක්ෂාව සහ තොරතුරු වර්ගීකරණය
දත්ත ආරක්ෂාව
කෘත්‍රිම බුද්ධිය
සටහන් තැබීම සහ හෙළිදරවු කිරීම
අභ්‍යන්තර වෙළඳාම
07 වචනාවලිය
08 මුද්‍රණය

06

දත්ත ආරක්ෂාව

අපි පෞද්ගලිකත්වය සඳහා සැමටම ඇති අයිතිය අපේ ආරක්ෂාවට යෝග්‍ය බව තේරුම් ගනිමු

අපි සකස් කරන පුද්ගලික දත්ත අපි ආරක්ෂා කරමු

සේවකයින්, ගනුදෙනුකරුවන්, සැපයුම්කරුවන්, ව්‍යාපාරික හවුල්කරුවන් සහ අනෙකුත් කොටස්කරුවන් විශ්වාසය මත පදනම්ව Continental සමග ඔවුන්ගේ පුද්ගලික දත්ත බෙදා ගනිති. අපි සැමගේ පුද්ගලික දත්ත වගකීමෙන් සහ ධර්මිෂ්ඨව හසුරුවන්නෙමු. ඒ අනුව, අපි දත්ත ආරක්ෂණ සංස්කෘතියක් ගොඩනැගීමට සහ මෙහෙයවීමට කැප වී සිටිමු. අපි සියලුම ආයතන හරහා දත්ත ආරක්ෂාව සඳහා ඉහළ ප්‍රමිති සකසන්නෙමු.

අපි පෞද්ගලිකත්ව අයිතිවාසිකමට ගරු කරමු

අපි සැමගේම පෞද්ගලිකත්වයට ඇති අයිතියට ගරු කරන අතර නිසි සැලකිල්ලෙන් ඔවුන්ගේ පුද්ගලික දත්ත ආරක්ෂා කරමු.

අපි අදාළ සියලුම දත්ත පෞද්ගලිකත්ව නීති සහ රෙගුලාසි අනුගමන කරන අතර අපේ එදිනෙදා වැඩ තුළ දත්ත ආරක්ෂණ කරුණු සලකා බලමු. අපි ප්‍රමාණවත් ලෙස පුද්ගලික දත්ත සැකසුම් කිරීමේ අයිතිය භාර ගනිමු.

අපි තාක්ෂණික සහ සංවිධානාත්මක කටයුතු හරහා පුද්ගලික දත්ත ආරක්ෂා කරමු

අපි අපේ සියලුම ව්‍යාපාරික ක්‍රියාකාරකම් තුළට සුදුසු දත්ත ආරක්ෂණ මූලධර්ම ඒකාබද්ධ කරමු. අපි පුද්ගලික දත්ත සාධාරණ සහ විනිවිද ආකාරයකින් සැකසුම් කිරීම තහවුරු කරමු. අපි (ප්‍රවේශ පාලන වැනි) සාධාරණ සහ සුදුසු දත්ත ආරක්ෂණ පිළිවෙත් සහ (ආකෘති කිරීම සහ සංකේතනය වැනි) තාක්ෂණික සහ සංවිධානාත්මක පියවර ක්‍රියාත්මක කර පවත්වා ගනිමු. එමගින්, අපි පුද්ගලික දත්ත අනවසර භාවිතයෙන් හෝ හෙළිදරවු කිරීමෙන් ආරක්ෂා කරමු.

අපි සැලකිලිමත් විය යුත්තේ ඇයි?

පුද්ගලික දත්ත ආරක්ෂා කිරීම අපේ අවංකත්ව සංස්කෘතියේ අනිවාර්ය අංගයකි.

තව සොයා ගන්න:

පුද්ගලික දත්ත ආරක්ෂාව පාලන කිරීමට සහ ඔබට සහය වීමට Continental හට binding corporate rules (BCR) නිබේ.

ඔබට සහය අවශ්‍ය නම්, දත්ත Compliance සම්බන්ධ කර ගන්න.

01 පෙරවදන
02 අපි අපේ අගයන් මත ක්‍රියා කරමු
03 අපි එකිනෙකාට ගරු කරමු
04 අපි වගකීමෙන් ක්‍රියා කරමු
05 අපි ව්‍යාපාරය සාධාරණව පවත්වමු
06 **අපි තොරතුරු සුරක්ෂිතව පරිහරණය කරමු**
- බුද්ධිමය දේපළ සහ රහසිගත තොරතුරු
- තොරතුරු ආරක්ෂාව සහ තොරතුරු වර්ගීකරණය
- දත්ත ආරක්ෂාව
- **කෘත්‍රිම බුද්ධිය**
- සටහන් තැබීම සහ හෙළිදරවු කිරීම
- අභ්‍යන්තර වෙළඳාම

07 වචනාවලිය
08 මුද්‍රණය

06

කෘත්‍රිම බුද්ධිය

අපි ඉතා හොඳ අනාගතයක් හැඩ ගැසීමට කෘත්‍රිම බුද්ධිය ධර්මිෂ්ඨව සහ වගකීමෙන් යුතුව සංවර්ධනය කර යොදවන්නෙම

අපි කෘත්‍රිම බුද්ධිය වගකීමෙන් යුතු ආකාරයකින් භාවිත කරමු

තාක්ෂණික සමාගමක් ලෙස, අපි පරිණාම වන තාක්ෂණය සමග වේගයෙන් ගමන් කළ යුතුය. අපි කෘත්‍රිම බුද්ධිය (AI) මෙම තාක්ෂණවලින් එකක් බව හඳුනා ගනිමු. අපේ ව්‍යාපාරය පරිවර්තනය කිරීම සහ වර්ධනය කිරීමට AI අපට අවස්ථාව දෙයි.

අපි AI හට සම්බන්ධ සදාචාරාත්මක අභියෝග සහ නීතිමය අවදානම් ගැන සැලකිලිමත් වන අතර එහි අපාලිත භාවිතය වළක්වන්නෙමු. අපි අපේ කොටස්කරුවන්ට – සේවකයින්ට, ගනුදෙනුකරුවන්ට, ව්‍යාපාරික හවුල්කරුවන්ට, කොටස්කරුවන්ට සහ සමස්ත සමාජයට – එහි විභව සහ ප්‍රතිලාභ අගුලු හැරීමට සදාචාරාත්මකව සහ වගකීමෙන් යුතුව AI භාවිත කරමු.

අපි ආරක්ෂිතව සහ ධර්මිෂ්ඨව AI සංවර්ධනය කරමු

AI සංවර්ධනය කිරීම සහ පුහුණු කිරීම අපෙන් මානව යහ පැවැත්මට ප්‍රමුඛත්වය දෙන, සදාචාරාත්මක මූලධර්මවලට අනුකූල වන සහ විවිධ තත්ත්ව යටතේ විනිවිදව ක්‍රියාත්මක වන පද්ධති සැලසුම් කිරීම අවශ්‍ය කරයි.

ආරක්ෂණ ඇතුළත් කිරීමෙන් සහ විභව පක්ෂග්‍රාහීත්ව ආමන්ත්‍රණ කිරීමෙන්, අපි වගකිව යුතු, විශ්වසනීය සහ සාධාරණ හැසිරීම් හරහා සදාචාරාත්මක අගයවල් සමග පෙළගැසෙන සහ විශ්වාසය පෝෂණය කරන AI නිර්මාණය කරමු.

අපි සැලකිලිමත් විය යුත්තේ ඇයි?

සදාචාරාත්මක AI ඇතිව, අපි අපේ අවංකත්ව සංස්කෘතිය ආරක්ෂා කරන අතර අපේ ව්‍යාපාරය පුළුල් කළ හැකි අතර අපේ කොටස්කරුවන් සඳහා තිරසාර වටිනාකමක් නිර්මාණය කළ හැක.

තව සොයා ගන්න:

ආචාර ධර්මීය භාවිතය සහ AI සංවර්ධනය පිළිබඳ වැඩි විස්තර සඳහා AI Code of Ethics බලන්න.

ඔබට සහය අවශ්‍ය නම්, දත්ත Compliance සම්බන්ධ කර ගන්න.

01 පෙරවදන
02 අපි අපේ අගයන් මත ක්‍රියා කරමු
03 අපි එකිනෙකාට ගරු කරමු
04 අපි වගකීමෙන් ක්‍රියා කරමු
05 අපි ව්‍යාපාරය සාධාරණව පවත්වමු
06 **අපි තොරතුරු සුරක්ෂිතව පරිහරණය කරමු**
- බුද්ධිමය දේපළ සහ රහසිගත තොරතුරු
- තොරතුරු ආරක්ෂාව සහ තොරතුරු වර්ගීකරණය
- දත්ත ආරක්ෂාව
- කෘත්‍රිම බුද්ධිය
- **සටහන් තැබීම සහ හෙළිදරවු කිරීම**
- අභ්‍යන්තර වෙළඳාම

07 වචනාවලිය
08 මුද්‍රණය

06

සටහන් තැබීම සහ හෙළිදරවු කිරීම

අපි Continental හි ආයතනික ප්‍රකාශ සත්‍යව සහ සාධාරණව ඉදිරිපත් කරමු

අපි මූල්‍ය අඛණ්ඩත්වය තහවුරු කිරීමට නිවැරදි පොත් සහ වාර්තා තබා ගනිමු

අපි සියලුම ගනුදෙනු නිරවද්‍යව ප්‍රකාශ වීමට අපේ පොත් සහ වාර්තා සම්පූර්ණ හා සත්‍ය ලෙස තබා ගනිමු. අපි ප්‍රමාණවත් සහ ක්‍රමවත් ගිණුම්කරණයට පහසුකම් සැලසීමට සහ ආයතනික ප්‍රකාශ සකස් කිරීම තුළ ඒවා නිසි ලෙස අනුගමන කිරීමට අපේ ක්‍රියාවලි සහ අභ්‍යන්තර පාලන සැලසුම් කරමු.

අපි දෝෂ වැළැක්වීමට ඇස් හතරේ මූලධර්මය සහ අනෙකුත් පාලන මූලධර්මයන් අනුගමන කරමු.

බාහිර සහ අභ්‍යන්තර විගණන ප්‍රමාණවත් වාර්තා තබා ගැනීම තහවුරු කිරීමට අපට උදවු කරයි.

අපි අපේ ආයතනික ප්‍රකාශ සාධාරණ ලෙස හෙළි කරන්නෙමු

අපි අපේ ආයතනික ප්‍රකාශ සාධාරණ ලෙස හෙළි කිරීම තුළින් විනිවිද බව පෙන්නුම් කරන අතර එයින් අපේ කොටස්කරුවන්ගේ විශ්වාසය ඵලදායී ලෙස දිනා ගනිමු.

අපි සැලකිලිමත් විය යුත්තේ ඇයි?

නිරවද්‍ය වාර්තා තබා ගැනීම සහ සාධාරණ හෙළිදරවු කිරීම කොටස්කරුවන් සමග විශ්වාසය ගොඩනැගීමට මූල්‍ය අවංකත්වය සහ විනිවිද බව තහවුරු කරයි. එය අවංකත්වය සහ වගවීම සඳහා වන අපේ කැප වීම පිළිබිඹු කරයි. මෙය විශ්වාසයේ සහ විශ්වසනීයත්වයේ සංස්කෘතියක් පෝෂණ කරයි.

තව සොයා ගන්න:

- Financial Reporting Manual
- Policy Record Retention

Continental හි වාර්ෂික වාර්තා සහ අනෙකුත් ආයතනික ප්‍රකාශ මෙහි ලැබේ:

Investor Relations News

01 පෙරවදන
02 අපි අපේ අගයන් මත ක්‍රියා කරමු
03 අපි එකිනෙකාට ගරු කරමු
04 අපි වගකීමෙන් ක්‍රියා කරමු
05 අපි ව්‍යාපාරය සාධාරණව පවත්වමු
06 **අපි තොරතුරු සුරක්ෂිතව පරිහරණය කරමු**
- බුද්ධිමය දේපළ සහ රහසිගත තොරතුරු
- තොරතුරු ආරක්ෂාව සහ තොරතුරු වර්ගීකරණය
- දත්ත ආරක්ෂාව
- කෘත්‍රිම බුද්ධිය
- සටහන් තැබීම සහ හෙළිදරවු කිරීම
- **අභ්‍යන්තර වෙළඳාම**

07 වචනාවලිය
08 මුද්‍රණය

06

අභ්‍යන්තර වෙළඳාම

අපි අභ්‍යන්තර වෙළඳාම වැළැක්වීම මගින් වෙළඳපොල සාධාරණත්වය ආරක්ෂා කරමු

අපි අභ්‍යන්තර තොරතුරු ගැන පරීක්ෂාකාරීව සිටින අතර අභ්‍යන්තර වෙළඳාමේ නිරත වන්නේ නැත

අපි අභ්‍යන්තර තොරතුරු හෙළිදරවු කරන්නේ නැත. තවද, අපි අභ්‍යන්තර තොරතුරු මත පදනම්ව අභ්‍යන්තර ගනුදෙනු වල නියැළෙන්නේ හෝ නියැළීමට උත්සාහ කරන්නේ හෝ නියැලීම නිර්දේශ කරන්නේ හෝ නැත.

අභ්‍යන්තර තොරතුරු යනු ප්‍රසිද්ධියට පත් කර නොමැති නිශ්චිත ස්වභාවයක ඕනෑම තොරතුරක් වන නමුත් එය කොටස් හිමියන් සහ / හෝ ආයෝජකයින් දැන ගත හොත් මූල්‍ය උපකරණයක් හෝ කිහිපයක් මත සැලකිය යුතු මිල විපාකයක් ඇති කිරීමට ඉඩ ඇත.

ඔබ සතුව (විභව) අභ්‍යන්තර තොරතුරු තිබේ නම්, ඔබ වහාම තත්කායී කමිටුවට දැනුම් දිය යුතුය.

අපි සැලකිලිමත් විය යුත්තේ ඇයි?

අභ්‍යන්තර වෙළඳාම තහනම් කිරීම අභ්‍යන්තර තොරතුරු ඇති අය අන් අයට වඩා අසාධාරණ වාසියක් ලබා ගැනීමට ඒවා සූරාකෑම වැළැක්වීම මගින් මූල්‍ය වෙළඳපොලවල සාධාරණත්වය සහතික කරයි.

තව සොයා ගන්න:

› Standard Insider Lists, Ad-hoc Publication and Prohibition of Insider Dealing

ඔබට සහය අවශ්‍ය නම්, නීති අංශය සම්බන්ධ කර ගන්න.

07

වචනාවලිය

අන්තර්ගතය

01 පෙරවදන
02 අපි අපේ අගයන් මත ක්‍රියා කරමු
03 අපි එකිනෙකාට ගරු කරමු
04 අපි වගකීමෙන් ක්‍රියා කරමු
05 අපි ව්‍යාපාරය සාධාරණව පවත්වමු
06 අපි තොරතුරු සුරක්ෂිතව පරිහරණය කරමු
07 **වචනාවලිය**
08 මුද්‍රණය

07

වචනාවලිය

Integrity Channels

Continental ආයතනය හෙළි කරන්නන් සඳහා වාර්තා කිරීමේ නාලිකා තුනක් සපයයි:

Tires:
- Integrity Platform
  continental.integrityline.app
- Integrity Email
  integrity@continental.integrityline.com
- Integrity Hotline
  +49 1802 737678 PIN 1819

ContiTech:
- Integrity Platform
  contitech.integrityline.app
- Integrity Email
  integrity@contitech.integrityline.com
- Integrity Hotline
  +49 30 99257146 PIN 1828

අනුග්‍රහය

අනුග්‍රහයක් යනු Continental ක්‍රියාකාරකම් සංවිධායකයෙකුට, කණ්ඩායමකට හෝ සංවිධානයකට මූල්‍ය හෝ වෙනත් සහයෝගයක් දෙන ව්‍යාපාරික විධිවිධානයකි, එය සන්නම් දෘශ්‍යතාව සහ “අනුග්‍රාහක,” “... හි නිල ටයරය,” නම් කිරීමේ අයිතිවාසිකම් හෝ ඒ හා සමාන මාතෘකා සඳහා හුවමාරු වෙයි.

අනුනාමකරණය

අනුනාමකරණය යනු අමතර තොරතුරු නොමැතිව නිශ්චිත පුද්ගලයෙකුට සම්බන්ධ කළ නොහැකි වන පරිදි පුද්ගලික දත්ත වෙනස් කිරීමේ ක්‍රියාවලිය වෙයි. මෙම අමතර තොරතුරු වෙන වෙනම ගබඩා කෙරෙන අතර තාක්ෂණික සහ සංවිධානාත්මක පියවර මගින් ආරක්ෂා කරනු ලබයි.

අපනයන පාලනය

අපනයන පාලනය යනු අදාළ රටෙන් පිටත භාණ්ඩ හෝ නිශ්චිත නිෂ්පාදන වර්ග විකිණීම සීමා කිරීම වෙයි.

අභ්‍යන්තර තොරතුරු

අභ්‍යන්තර තොරතුරු යනු ප්‍රසිද්ධියට පත් කර නොමැති නිශ්චිත ස්වභාවයක ඕනෑම තොරතුරක් වන නමුත් එය කොටස් හිමියන් සහ / හෝ ආයෝජකයින් දැන ගත හොත් මූල්‍ය උපකරණයක් හෝ කිහිපයක් මත සැලකිය යුතු මිල විපාකයක් ඇති කිරීමට ඉඩ ඇත.

අයත් වීම

පුද්ගලයා තම අව්‍යාජ ස්වභාවය සඳහා අගය කරනු ලබන සහ හවුල් අරමුණකට දායක විය හැකි ප්‍රජා හැඟීම.

අල්ලස

පුද්ගලයා තම අව්‍යාජ ස්වභාවය සඳහා අගය කරනු ලබන සහ හවුල් අරමුණකට දායක විය හැකි ප්‍රජා හැඟීම.

අවදානම

අවදානමක් යනු බලපෑම, සිදුවීමේ සංඛ්‍යාව හෝ දෙකම විචලනය විය හැකි සිදුවීමක් හෝ තත්වයක් වන අතර එම නිසා ප්‍රමාණවත් නිශ්චිත භාවයකින් පුරෝකථනය කිරීමට අපහසු නමුත් එය සිදු වන්නේ නම් Continental හි ව්‍යාපාරික අරමුණු ඉටු කරගැනීමට අහිතකර ලෙස බලපෑ හැක.

අවස්ථාව

අවස්ථාවක් යනු ධනාත්මක ප්‍රතිඵලයක් රැඳවී තිබිය හැකි සිදුවීමකි.

ඇතුළත් කර ගැනීම

සියලු දෙනා සහභාගී කරගැනීම, ගරු කිරීම සහ සාධාරණ ලෙස සැලකීම තහවුරු කිරීමේ ක්‍රියාමාර්ග.

01 පෙරවදන
02 අපි අපේ අගයන් මත ක්‍රියා කරමු
03 අපි එකිනෙකාට ගරු කරමු
04 අපි වගකීමෙන් ක්‍රියා කරමු
05 අපි ව්‍යාපාරය සාධාරණව පවත්වමු
06 අපි තොරතුරු සුරක්ෂිතව පරිහරණය කරමු
07 **වචනාවලිය**
08 මුද්‍රණය

07

වචනාවලිය

කෘත්‍රිම බුද්ධිය (AI)

AI යනු ඉගෙනීම, තර්කනය, ගැටළු විසඳීම හෝ අන්තර්ගතයේ ස්වයංක්‍රීය උත්පාදනය වැනි මානව බුද්ධිය අවශ්‍ය කාර්යයන් ඉටු කළ හැකි බුද්ධිමත් මෘදුකාංගයකි. වැඩිදුර තොරතුරු සඳහා කරුණාකර කොන්ටිනෙන්ටල් හි AI ආචාර ධර්ම පද්ධතිය බලන්න.

තහනම් යුද්ධෝපකරණ

Continental හි ප්‍රතිපත්ති හමුදා ව්‍යාපාර යටතේ තහනම් කර ඇති ඕනෑම යුද්ධෝපකරණ.. මෙයට සම්ප්‍රදායික අවි සහ ද්විත්ව භාවිත භාණ්ඩ සහ තාක්ෂණ සඳහා වන අපනයන පාලන පිළිබඳ වසෙනාර් ගිවිසුමේ යුද්ධෝපකරණ ලැයිස්තුවේ ඇති පරිදි 1, 2, 3, 4, 5, 7, 8, 12, 15 f., 16 සහ 19 යන කාණ්ඩවල යුද්ධෝපකරණ ඇතුළු වෙයි.

තාක්ෂණික අනුකූලතා කළමනාකරණ පද්ධතිය (tCMS)

තාක්ෂණික අනුකූලතා කළමනාකරණ පද්ධතිය යනු නිෂ්පාදන උපාය මාර්ගී ක්‍රියාවලියේ සිට අපේක්ෂිත බැහැර කිරීම දක්වා සමස්ත නිෂ්පාදන ජීවන චක්‍රය තුළම තාක්ෂණික අනුකූලතාව සක්‍රීය කිරීමේ සහ ආරක්ෂා කිරීමේ පුළුල් පද්ධතිය (එනම් රාමුව / මෙහෙයුම් ආකෘතිය) වෙත යොමු වෙයි.

තාක්ෂණික අනුකූලතාව

තාක්ෂණික අනුකූලතාව යනු නිෂ්පාදන ආරක්ෂාව, නිෂ්පාදන අනුකූලතාව, නිෂ්පාදන පාරිසරික අනුකූලතාව, නිෂ්පාදන සයිබර් ආරක්ෂාව සහ පෞද්ගලිකත්වය සහ බුද්ධිමය දේපළ යන සියලුම නිෂ්පාදන තාක්ෂණික අනුකූලතා කාණ්ඩ පහ සම්බන්දයෙන් ඒවායේ බැඳීම නිෂ්පාදන අවශ්‍යතාවලට අනුකූල වන බව වෙයි. තාක්ෂණික අනුකූලතා බැඳීම් නීතිමය රෙගුලාසි, බාහිර ප්‍රමිති සහ ගිවිසුම්ගතව එකඟ වූ පාරිභෝගික අවශ්‍යතා මෙන්ම අදාළ Continental හි අභ්‍යන්තර නීති සහ Continental හි බාහිරව සන්නිවේදන කෙරෙන ස්වයං-බැඳීම්වලින් පැන නගියි.

තෑගි සහ සංග්‍රහය

ත්‍යාග සහ ආගන්තුක සත්කාරය යනු Continental වෙතින් පිටත කෙනෙකු සම්බන්ධ කර ගනිමින් අපේ සේවකයින් හෝ නියෝජිතයින් විසින් ව්‍යාපාරික සන්දර්භයක් තුළ පිරිනැමෙන, ප්‍රදානය කෙරෙන, ඉල්ලා සිටින හෝ ලබා ගන්නා ඕනෑම වටිනාකමක් ඇති ඕනෑම දෙයකි.

තොරතුරු ආරක්ෂාව

Continental හි තොරතුරු සහ තොරතුරු පද්ධති ප්‍රහාරයකින් හෝ අනවශ්‍ය ක්‍රියාවකින් ආරක්ෂා කිරීම, තොරතුරු තාක්ෂණය, මෙහෙයුම් තාක්ෂණය හෝ Continental ඇතුළත තොරතුරු තාක්ෂණය නොවන පරිසර තුළ හෝ හරහා තොරතුරු සැකසුම් කිරීම, මාරු කිරීම සහ ගබඩා කිරීම සිදු කරන සෑම අවස්ථාවකම රහස්‍ය භාවය, අවංකකම සහ ලබා ගත හැකි බව තහවුරු කිරීම.

ත්‍රස්තවාදී අරමුදල් සැපයීම

ත්‍රස්තවාදී අරමුදල් සැපයීම යනු ත්‍රස්තවාදී අරමුණු සඳහා අරමුදල් රැස් කිරීම හෝ සැපයීම වෙයි.

දත්ත

නිරීක්ෂණ, මිනුම්, පර්යේෂණ හෝ විශ්ලේෂණ මගින් රැස් කරන ලද තොරතුරු එකතුවක් වන අතර එයට කරුණු, සංඛ්‍යා, නම්, රූප හෝ වෙනත් නිශ්චිත විස්තර අඩංගු වේ.

01 පෙරවදන
02 අපි අපේ අගයන් මත ක්‍රියා කරමු
03 අපි එකිනෙකාට ගරු කරමු
04 අපි වගකීමෙන් ක්‍රියා කරමු
05 අපි ව්‍යාපාරය සාධාරණව පවත්වමු
06 අපි තොරතුරු සුරක්ෂිතව පරිහරණය කරමු
07 **වචනාවලිය**
08 මුද්‍රණය

07

වචනාවලිය

නිරවද්‍ය ස්වභාවය

පවතින හෝ සාධාරණ ලෙස පැවැතීමට අපේක්ෂා කළ හැකි සන්දර්භ සමූහයක් හෝ සිදු වී ඇති හෝ සාධාරණ ලෙස සිදු වීමට අපේක්ෂා කළ හැකි සිදු වීමක් පෙන්නුම් කරන්නේ නම් තොරතුරු නිරවද්‍ය ස්වභාවයක් ගනියි.

නිෂ්පාදන අනුකූලතාව

දැන්වීම් කෙරෙන සහ සත්‍ය කාර්යීවල නිෂ්පාදන ආශ්‍රිත අනුකූලතාව, නිෂ්පාදන තොරතුරුවල සහ ලියකියවිලිවල අනුකූලතාව සහ අනෙකුත් සියලුම අදාළ නියාමන අවශ්‍යතාවලට ගරු කළ යුතු ම ය.

නිෂ්පාදන ආරක්ෂාව

දෝෂ සහිත හෝ අනාරක්ෂිත නිෂ්පාදන කිසිවක් වෙළඳපොලේ තැබිය නොහැක. මෙය නිෂ්පාදනවල අපේක්ෂිත භාවිතය සහ පුරෝකථනය කළ හැකි අනිසි භාවිතය යන දෙකටම මෙන්ම සීමා කෙරෙන ද්‍රව්‍ය භාවිතයටද අදාළ වෙයි.

නිෂ්පාදන ජීවන චක්‍රය

නිෂ්පාදනයක මුල් පියවරවල සිට ආයු කාලය අවසන් කිරීමේ වගකීම දක්වා විහිදෙන අදාළ අගය එකතු වන ක්‍රියාවලි සඳහා අනිවාර්‍ය මූලික අවශ්‍යතා.

නිෂ්පාදන පාරිසරික අනුකූලතාව

(ද්‍රව්‍ය සහ ශක්‍තිය ඇතුළුව) නිෂ්පාදන ආශ්‍රිත විමෝචන මෙන්ම ඒවායේ පරිභෝජනය, ද්‍රව්‍ය සහ චක්‍රීය ආර්ථික ප්‍රවේශ නියාමන පාරිසරික ආරක්ෂණ අවශ්‍යතාවලට අනුකූල විය යුතු ම ය.

නිෂ්පාදන සයිබර් ආරක්ෂාව සහ පෞද්ගලිකත්වය

නිෂ්පාදන ආශ්‍රිත මෘදුකාංග සයිබර් ආරක්ෂාව, දෘඩාංග සයිබර් ආරක්ෂාව, දත්ත පෞද්ගලිකත්වය සහ තොරතුරු තාක්ෂණ සයිබර් ආරක්ෂාව යන ඒවායේ අවශ්‍ය රහස්‍ය භාවය, අවංකත්වය සහ දත්ත ලබා ගැනීමේ හැකියාව තහවුරු කළ යුතු ම ය.

තොරතුරු ආරක්ෂාව

Continental හි තොරතුරු සහ තොරතුරු පද්ධති ප්‍රහාරයකින් හෝ අනවශ්‍ය ක්‍රියාවකින් ආරක්ෂා කිරීම, තොරතුරු තාක්ෂණය, මෙහෙයුම් තාක්ෂණය හෝ Continental ඇතුළත තොරතුරු තාක්ෂණය නොවන පරිසර තුළ හෝ හරහා තොරතුරු සැකසුම් කිරීම, මාරු කිරීම සහ ගබඩා කිරීම සිදු කරන සෑම අවස්ථාවකම රහස්‍ය භාවය, අවංකකම සහ ලබා ගත හැකි බව තහවුරු කිරීම.

පහසුකම් ගෙවීම්

පහසුකම් ගෙවීමක් යනු රාජ්‍ය සේවයක් වේගවත් කිරීමට හෝ සුරක්ෂිත කිරීමට රජයේ නිලධාරියෙකුට හෝ ආයතනයකට කෙරෙන ගෙවීමකි.

පළි ගැනීම

පළි ගැනීමේ තර්ජන සහ පළි ගැනීමේ උත්සාහ ඇතුළුව පළි ගැනීම් යනු විමර්ශනයකදී තොරතුරු සැපයීම සම්බන්ධයෙන් හෙළි කරන්නෙකුට එරෙහිව ගන්නා ඕනෑම අහිතකර ක්‍රියාමාර්ගයකි.

පුණ්‍ය පරිත්‍යාග

පුණ්‍යාධාර පරිත්‍යාගයක් යනු වටිනා ඕනෑම දෙයක් (උදා: මුදල්, සේවකයින් විසින් දායක කරන ලද වැඩ කරන වේලා, ද්‍රව්‍ය, නිෂ්පාදන හෝ සේවා) පුණ්‍යාධාර ලාභ නොලබන කටයුත්තකට ආපසු ගෙවීමකින් තොරව ලබා දීම වෙයි.

01 පෙරවදන
02 අපි අපේ අගයන් මත ක්‍රියා කරමු
03 අපි එකිනෙකාට ගරු කරමු
04 අපි වගකීමෙන් ක්‍රියා කරමු
05 අපි ව්‍යාපාරය සාධාරණව පවත්වමු
06 අපි තොරතුරු සුරක්ෂිතව පරිහරණය කරමු
07 **වචනාවලිය**
08 මුද්‍රණය

07

වචනාවලිය

පුද්ගලික දත්ත

පුද්ගලික දත්ත යනු පුද්ගලයෙකු හඳුනා ගත හැකි ඕනෑම තොරතුරකි.

බැදියා පිළිගැටුම

බැදියා පිළිගැටුමක් යනු කෙනෙකුගේ පෞද්ගලික ලැදිකම් ඒ අයගේ වෘත්තීය විනිශ්චයට බාධා කළ හැකි තත්ත්වයකි.

බුද්ධිමය දේපළ

බුද්ධිමය දේපළවලට පේටන්ට් බලපත්‍ර, වෙළඳ ලකුණු සහ ලාංඡන, ප්‍රකාශන හිමිකම්, නිර්මාණ සහ වෙළඳ රහස් සහ දැනුම හෝ ප්‍රසිද්ධියේ හෝ සාමාන්‍යයෙන් නොලැබෙන තොරතුරු වැනි රහසිගත තොරතුරු ලෙස පොදුවේ හැඳින් වෙන හිමිකාර තොරතුරුවල වෙනත් ආකාර ඇතුළු වෙයි.

මංකොල්ල කෑම

වංචාව යනු සේවකයෙකුට පවරන ලද අරමුදල් පුද්ගලික ලාභ ප්‍රයෝජන සඳහා හෝ වෙනත් අනවසර භාවිතයක් සඳහා අයථා ලෙස පරිහරණය කිරීම වෙයි.

මුදල් ශෝධනය

මුදල් ශෝධනය යනු නීති විරෝධී ක්‍රියාකාරකම්වලින් උපයන ලද මුදල එහි නීති විරෝධී මූලාරම්භය සැඟවීමට ගනුදෙනු සහ ව්‍යාපාර මාලාවක් හරහා එය නීත්‍යානුකූල බව දක්වන, ත්‍රස්තවාදී අරමුදල් සැපයීමට දායක විය හැකි ක්‍රියාවලිය වෙයි.

මූල්‍ය උපකරණ

මූල්‍ය උපකරණ යනු කොටස්, බැඳුම්කර, ව්‍යුත්පන්න සහ මූල්‍යමය වටිනාකමක් ඇති අනෙකුත් කොන්ත්‍රාත්තු වැනි වෙළඳාම් කළ හැකි වත්කම් වෙයි.

යුධ අවි

(නව වන රෙගුලාසි මගින් සංශෝධන කරන ලද පරිදි 1998 පෙබරවාරි 26 වන දින යුද අවි ලැයිස්තුවෙහි, ෆෙඩරල් නීති ගැසට් පත්‍රයේ I, පිටුව 385 හට අනුව) යුද අවි යනු නිල ජර්මානු යුද අවි ලැයිස්තුවේ නම් කර ඇති අයිතම වෙයි.

රජයේ නිලධාරියා

රාජ්‍ය නිලධාරියෙක් යනු ව්‍යවස්ථාදායක, පරිපාලන හෝ අධිකරණ තනතුරක් දරන, රාජ්‍ය ආයතනයක් හෝ (රාජ්‍ය සතු හෝ රාජ්‍ය පාලිත) පොදු ව්‍යවසායක් ඇතුළුව පොදු කාර්යයක් ඉටු කරන, දේශපාලන පක්ෂයක නිලධාරියෙකු හෝ අපේක්ෂකයෙකු වන සහ රාජ්‍ය ජාත්‍යන්තර සංවිධානයක නිලධාරියෙකු හෝ නියෝජිතයෙකු වන හෝ ඉහත නිර්ණායකවලට ගැලපෙන පුද්ගලයෙකුගේ පළමු හෝ දෙවන මට්ටමේ ඥාතියෙකු හෝ කලත්‍රයෙකු වන ඕනෑම පුද්ගලයෙකි.

වංචාව

වංචාවක් යනු පුද්ගලයෙකුගේ හෝ සංවිධානයක සම්පත් නීති විරෝධී ලෙස ලබා ගැනීමට රැවටීම මත රඳා පවතින ඕනෑම ක්‍රියාකාරකමක් වෙයි.

වැළැක්වීම

පුද්ගලයෙකු කෙරෙහි සතුරුකම හෝ අකමැත්ත පෙන්වන වාචික, දෘශ්‍ය හෝ ශාරීරික හැසිරීම්.

01 පෙරවදන
02 අපි අපේ අගයන් මත ක්‍රියා කරමු
03 අපි එකිනෙකාට ගරු කරමු
04 අපි වගකීමෙන් ක්‍රියා කරමු
05 අපි ව්‍යාපාරය සාධාරණව පවත්වමු
06 අපි තොරතුරු සුරක්ෂිතව පරිහරණය කරමු
07 **වචනාවලිය**
08 මුද්‍රණය

07

වචනාවලිය

වෙනස් කොට සැලකීම

පුද්ගලයින්ගේ වයස, ස්ත්‍රී පුරුෂ භාවය, අනන්‍යතාව, ජාතිකත්වය, ජනවාර්ගිකත්වය, ආගම, ලෝක දැක්ම, ලිංගික නැඹුරුව හෝ ආබාධිත බව මත පදනම්ව අසාධාරණ හෝ අගතිගාමී ආකාරයකින් වෙනස් කොට සැලකීම.

ව්‍යාපාරික හවුල්කරු

ව්‍යාපාරික හවුල්කරුවෙකු යනු නිෂ්පාදනයක්, සේවයක්, මිලදී ගැනීමක්, කුලියට දීමක් හෝ වෙනත් ගිවිස ගත් ගිවිසුමක් වැනි නීතිමය පදනමක් නොසලකා Continental සමග භාණ්ඩ, සේවා හෝ අරමුදල් සෘජුව හුවමාරු කරන ඕනෑම ස්වභාවික හෝ නීත්‍යානුකූල පුද්ගලයෙක්, ආයතනයක් හෝ සභාවක්.

ව්‍යාපාරික හවුල්කරු යථායෝග්‍ය

විශ්වසනීය සහ විශ්වාසවන්ත ව්‍යාපාරික හවුල්කරුවන් සමග අපි සම්බන්ධ වීම තහවුරු කිරීමට Continental හි ප්‍රවේශය. මෙය ඔබේ ගනුදෙනුකරු දැන ගැනීමේ (KYC) පරීක්ෂාවක් ලෙස ද හැඳින් වෙයි.

සංකේතනය

සංකේතනය යනු අනවසර ප්‍රවේශය වැළැක්වීම සඳහා දත්ත කේතනය කළ ආකෘතියකට පරිවර්තන කිරීමේ ක්‍රියාවලිය වන අතර, එය බලය ලත් පාර්ශවවල පමණක් විකේතන යතුරක් භාවිත කර තොරතුරු වෙත ප්‍රවේශ විය හැකි බව ඵලදායී ලෙස සහතික කෙරේ.

සංගති විරෝධය

තරඟ නීති ලෙස ද හැඳින් වෙන සංගති විරෝධ නීති, තරඟකරුවන් අතර සංවේදී තොරතුරු හුවමාරු කර ගැනීම සහ හුවමාරු කර ගැනීම සහ වෙළඳපොලේ ප්‍රමුඛ ස්ථානයක් හිමි සමාගම්වල අපයෝජන හැසිරීම වැනි තරඟකාරීත්වය සීමා කරන භාවිත තහනම් කරයි.

සම්බාධක

සම්බාධක යනු වෙනත් රටවල්, කර්මාන්ත, සංවිධාන හෝ පුද්ගලයින් සමග වෙළඳාම හෝ වෙනත් කිසියම් ආර්ථික සම්බන්ධතා / සබඳතා සීමා කිරීමට ක්‍රියාත්මක වන පියවර සඳහන් කරයි.

සුවිශේෂී ගිවිසුම්

සුවිශේෂීතා ගිවිසුම් ව්‍යාපාරික හවුල්කරුවන් සඳහා සීමා පනවයි. මෙම සීමාවලට ඔවුන් තනි සැපයුම්කරුවෙකුට ඔවුන් බැඳින කිරීම, සේවය කිරීමට අවසර දෙනු ලබන ගනුදෙනුකරුවන් සීමා කිරීම, ඔවුන්ට භාවිත කළ හැකි විකුණුම් නාලිකා හෝ ඔවුන්ට ක්‍රියාත්මක වීමට අවසර දී ඇති භූගෝලීය කලාප ඇතුළු වේවි.

සොරකම

සොරකම යනු වෙනත් කෙනෙකුගේ දේපළ ඔවුන්ගේ අවසරයෙන් හෝ කැමැත්තෙන් තොරව තමන්ට හෝ තෙවන පාර්ශවයකට පවරා ගැනීමට අයුතු ලෙස අත්පත් කර ගැනීමේ ක්‍රියාව වෙයි.

හෙළි කරන්නා

හෙළි කරන්නෝ යනු අවංකත්ව නාලිකාවක් හරහා සත්‍ය යැයි විශ්වාස කිරීමට සාධාරණ හේතු ඇති විය හැකි විෂමාචාර පිළිබඳ තොරතුරු වාර්තා කරන පුද්ගලයෝ වෙති.

Continental Aktiengesellschaft

Continental-Plaza 1

D-30175 Hanover

Duitsland

Voor al zijn dochterondernemingen

Telefoon: +49 511 938-01

Fax: +49 511 938-81770

E-mail: mail_service@conti.de

Continental AG is ingeschreven in het register van ondernemingen van de lokale rechtbank van Hannover onder nr. HR B 3527.

Btw-nr. DE115645799

Continental

The Future in Motion

07/2026